ASSOCIATION OF ACCOUNTING TECHNICIANS OF SRI LANKA

# AAT Sri Lanka සාමාජිකත්වය ලබාගැනීමට උපදෙස්

## A සාමාජිකත්ව නිර්ණායක

### සාමාජිකත්වය [MAAT]

**ඒඒටී අවසන් විභාගය සමතුන් — AAT PASSED FINALISTS [PF]**

1. **වසරක (01) ප්‍රායෝගික පුහුණුව/පළපුරුද්ද** සමඟ AAT ව්‍යාපාරික පාසල මඟින් පවත්වන **පුද්ගල හා නායකත්ව කුසලතා** (PLS) **දෙදින වැඩමුළුව** සම්පූර්ණ කිරීම (පුහුණු වාර්තා ඉදිරිපත් කළ යුතුය) **හෝ**
2. **විශේෂ ක්‍රමවේදය – පුහුණු වාර්තා ඉදිරිපත් කිරීම වෙනුවට වසර 4 ක සේවා සහතික සහ පුද්ගල හා නායකත්ව කුසලතා** (PLS) **දෙදින වැඩමුළුව සම්පූර්ණ කිරීම සමඟ අයදුම් කිරීම**

   **AAT අවසන් විභාගය සමතුන්ට** වසර 4ක සේවා සහතික සමඟ වන විශේෂ ක්‍රමවේදය යටතේද සාමාජිකත්වය සඳහා අයදුම් කළ හැක. එහිදී වසර 4 ක සේවා කාලයට අමතරව AAT ව්‍යාපාරික පාසල මඟින් පවත්වන **පුද්ගල හා නායකත්ව කුසලතා** (PLS) **දෙදින වැඩමුළුව** ද සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.

   මෙම ක්‍රමවේදය යටතේ ගිණුම්කරණය / මූල්‍ය / විගණනය / බදුකරණය / විශ්ව විද්‍යාල දේශන (ගිණුම්කරණය / මූල්‍ය / විගණන / බදුකරණ) ක්ෂේත්‍රවල නියුතු **වසර 4 ට වඩා සේවා පළපුරුද්ද ඇති** අවසන් විභාගය සමතුන්ට පුහුණු වාර්තා වෙනුවට **විස්තරාත්මක සේවා සහතික ඉදිරිපත් කිරීමෙන්** අයදුම් කළ හැක.

**සෘජු ක්‍රමය** වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA Sri Lanka) CBA (පුහුණු වාර්තා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ප්‍රදානය වන) / CAB / අන්තර්මධ්‍ය / ආවසරික **සහතිකය සමඟ වසර 2 ක පළපුරුද්ද** (CBA සඳහා වසරක පළපුරුද්ද) සහ AAT ව්‍යාපාරික පාසල මගින් පවත්වන **පුද්ගල හා නායකත්ව කුසලතා** (PLS) **වැඩමුළුව** සම්පූර්ණ කිරීම (සේවා සහතික ඉදිරිපත් කළ යුතුය)(යාවජීව සාමාජිකත්වයට අයදුම්කළ යුතුය) **හෝ**

CIMA / ACCA ආයතන වල Advanced Diploma සහතිකය සමඟ වසර 2 ක පුහුණුව / පළපුරුද්ද සහ AAT ව්‍යාපාරික පාසල මගින් පවත්වන **පුද්ගල හා නායකත්ව කුසලතා** (PLS) **වැඩමුළුව** සම්පූර්ණ කිරීම (පුහුණු වාර්තා ඉදිරිපත් කළ යුතුය) (යාවජීව සාමාජිකත්වයට අයදුම්කළ යුතුය)

### ජ්‍යෙෂ්ඨ සාමාජිකත්වය [SAT]

**MAAT සාමාජිකත්වය හරහා උසස් වීම**

1. MAAT සාමාජිකත්වය ලබාගැනීමෙන් පසු **විධායක ශ්‍රේණියේ ගිණුම්කරණ තනතුරක වසර 5 ක** සේවා කාලයක් සම්පූර්ණ කිරීම. **හෝ**
2. MAAT සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසු **විධායක ශ්‍රේණියේ නමුත් ගිණුම්කරණ නොවන ක්ෂේත්‍රයක** නියුතු සාමාජිකයන් හට **වසර 5 ක** සේවා පළපුරුද්ද සහ AAT **ව්‍යාපාරික පාසල මගින් පවත්වන** උසස් පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම හරහා ද අයදුම් කළ හැක.

සියලුම සාමාජිකයන් සෑම **වසර 3 කට වරක් CPD** ලකුණු 120 ක් සම්පූර්ණ කළ යුතුය. (60 verifiable CPDs)

**සෘජු ක්‍රමය** CA Sri Lanka/CIMA/ACCA **අවසන් විභාගය සමත්වීම** (Passed Finalist) සහ **වසර 3 ක** ප්‍රායෝගික පුහුණුව / පළපුරුද්ද (යාවජීව සාමාජිකත්වයට අයදුම්කළ යුතුය)

### අධි සාමාජිකත්වය FMAAT

**SAT සාමාජිකත්වය හරහා උසස් වීම** **SAT සාමාජිකත්වය ලබාගැනීමෙන් පසු කළමනාකරණ ශ්‍රේණියේ වසර 5 ක** පළපුරුද්ද. සියලුම සාමාජිකයන් සෑම **වසර 3 කට වරක් CPD** ලකුණු 120 ක් සම්පූර්ණ කළ යුතුය. (60 verifiable CPDs)

**සෘජු ක්‍රමය**

1. CA Sri Lanka / CIMA / ACCA **සාමාජිකත්වය ලබාගැනීමෙන් පසු වසර 3 ක** කළමනාකරණ ශ්‍රේණියේ පළපුරුද්ද.(යාවජීව සාමාජිකත්වයට අයදුම්කළ යුතුය) **හෝ**
2. මහාචාර්ය තනතුර හොබවන / ආචාර්ය උපාධියක් දරණ සහ ගිණුම්කරණ / මූල්‍ය ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇති ඒඒටී අවසන් විභාගය සමතුන් / සාමාජිකයන් (යාවජීව සාමාජිකත්වය සඳහා අයදුම් කළ යුතුය.)

(මෙහි සඳහන් කර ඇති දැනට පවත්නා නිර්ණායක වෙනස්වීමට භාජනය විය හැක. කරුණාකර ඔබ සාමාජිකත්වය සඳහා අයදුම් කරන අවස්ථාවේදී පවත්නා නිර්ණායක පිළිබඳව, අයදුම් කිරීමට ප්‍රථම යාවත්කාලීන වන්න.)

## B

**MAAT සාමාජිකත්වය** අයදුම් කරන්නන් සාමාජිකත්ව අයදුම්පතට අමුණා එවිය යුතු ලේඛන

- B.1 **පුහුණු / පළපුරුද්ද පිළිබඳ වාර්තා**
- B.2 වර්තමාන සහ පැරණි සේව්‍යයන්ගෙන් ලබාගත් **සේවා සහතික වල සහතික කළ පිටපත්** (මුල් පිටපත ආයතනය නමට නිකුත් කර ඇත්නම් මුල් පිටපත ඉදිරිපත් කළ යුතුය)
- B.3 **අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම්වලට අදාළ සහතික** / ඒඒටී අවසන් විභාගයට අදාළ ප්‍රතිඵල සටහන සහ සහතික පත්‍රයේ සහතික කරන ලද පිටපත්
- B.4 පුද්ගල හා නායකත්ව කුසලතා **(PLS) වැඩමුළුවේ සහතික පත්‍රයේ** පිටපතක් (සාමාජිකත්වයට අයදුම් කරන විට ලැබී ඇත්නම්). (**SAT/FMAAT** අයදුම්කරුවන්ට අදාළ නොවේ)
- B.5 **ගෙවීම් තහවුරු කිරීමේ ලේඛන** (බැංකු තැන්පතු / මුදල් ලදුපත / චෙක්පත / online ලදුපත ආදිය)
- B.6 තම නම පිටුපස ලියන ලද **මුද්දර ප්‍රමාණයේ වර්ණ ඡායාරූප 2 ක්**
- B.7 **ජාතික හැඳුනුම්පතෙහි** සහ **උප්පැන්න සහතිකයේ** සහතික කළ පිටපත්

අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත.

**C**

**SAT / FMAAT** සාමාජිකත්වය සඳහා අයදුම් කරන්නන් සාමාජිකත්ව අයදුම්පතට අමුණා එවිය යුතු ලේඛන

C.1 **අධ්‍යාපන / වෘත්තීය / සාමාජිකත්ව සහතික** වල සහතික කළ පිටපත්

C.2 වර්තමාන සහ පැරණි සේව්‍යයන්ගෙන් ලබාගත් **සේවා සහතික වල සහතික කළ පිටපත්** (මුල් පිටපත AAT ආයතනය නමට නිකුත් කර ඇත්නම් මුල් පිටපත ඉදිරිපත් කළ යුතුය)

C.3 **ගෙවීම් තහවුරු කිරීමේ ලේඛන** (බැංකු ගෙවුම්පත / මුදල් ලදුපත / චෙක්පත / online ලදුපත ආදිය)

C.4 තම නම පිටුපස ලියන ලද **මුද්දර ප්‍රමාණයේ වර්ණ ඡායාරූප** 2 ක්

C.5 **ජාතික හැඳුනුම්පතෙහි** සහ **උප්පැන්න සහතිකයේ** සහතික කළ පිටපත්

C.6 Powerpoint **ඉදිරිපත් කිරීමක්** [SAT සහ FMAAT සාමාජිකත්ව ප්‍රභේද සඳහා සෘජුව අයදුම් කරන/උසස් කරන අයදුම්කරුවන් (වරලත් ගණකාධිකාරීවරුන් හැර) සඳහා] (ගිණුම්කරණයට අදාළ Slides 10ක් සහ විනාඩි 15ක කාලයකට යටත්ව ඉදිරිපත් කිරීමක් අදාල වේ)

මීට අමතරව **ගිණුම්කරණ නොවන ක්ෂේත්‍රයක** විධායක පළපුරුද්ද යටතේ අයදුම් කරන්නේ නම් AAT **ව්‍යාපාරික පාසලේ** උසස් පාඨමාලාවක සහතික පත්‍රයේ පිටපතක්.

අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත.

**D**

පුහුණු / සේවා කාලය මාස වලින් සඳහන් කළ යුතුය. (MAAT සඳහා අදාළ වේ)

**E**

යම් හෙයකින් ඔබ සාමාජිකත්වය ලබාගැනීමේ සුදුසුකම් නොසැපිරීම හේතුවෙන් ඔබගේ අයදුම්පත ප්‍රතික්ෂේප වුවහොත්, ඔබ ගෙවූ මුදල් නැවත ලබාගැනීම මාස 6 ක් පමණ දක්වා දීර්ඝ විය හැක. මේ සඳහා ඔබ විසින් ලිඛිත ඉල්ලීමක් (ගෙවීම් වවුචරයේ මුල් පිටපතද සමඟ) කළ යුතුය.

**F**

අයදුම්පතෙහි අදාළ **සියලුම විස්තර සම්පූර්ණ කළ යුතුය.** සියලුම තොරතුරු ඉදිරිපත් නොකිරීම අයදුම්පතට අදාළ ක්‍රියාවලිය ප්‍රමාද කිරීමට හේතුවනු ඇත.

**G**

අයදුම් පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කොට එවීමෙන් පසු MAAT අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට / SAT/FMAAT අයදුම්කරුවන් Powerpoint ඉදිරිපත් කිරීමක් සඳහා කැඳවනු ලැබේ. ඉන්පසුව සාමාජික කමිටුව විසින් නිර්දේශ කොට AAT පාලක මණ්ඩලය විසින් සාමාජිකත්වය අනුමත කළ යුතු අතර මේ සඳහා සති 6 ක් පමණ ගත වනු ඇත.

## සාමාජික ගාස්තු

**(2025.06.20 සිට බලපැවැත් වේ.)**

| **නව අයදුම්කරුවන් සඳහා** | | |
|---|---|---|
| **ප්‍රභේදය** | **සාමාන්‍ය (Ordinary) ලියාපදිංචි ගාස්තුව (වාර්ෂිකව අලුත් කළ යුතුය)** | **යාවජීව (Life) සාමාජිකත්ව ගාස්තුව (වාර්ෂික අලුත් කිරීමේ ගාස්තු නොමැත)** |
| MAAT (AAT අවසන් විභාගය සමතුන් සඳහා) | රු. 7,000<br>වසර 4ක සේවා සහතික යටතේ වන විශේෂ ක්‍රමවේදය රු. 10,000 | රු. 35,000 |
| MAAT (සෘජු) | N/A | රු. 45,000 |
| SAT (සෘජු) | N/A | රු. 50,000 |
| FMAAT (සෘජු) | N/A | රු. 60,000 |

| **පවත්නා සාමාජිකත්වය ඊළඟ මට්ටමට උසස් කිරීම (Upgrading) සඳහා** | | | |
|---|---|---|---|
| | ORDINARY - ORDINARY | ORDINARY - LIFE | LIFE - LIFE |
| MAAT to SAT | Rs. 8,000 | Rs. 40,000 | Rs. 5,000 |
| SAT to FMAAT | Rs. 9,000 | Rs. 45,000 | Rs. 10,000 |

(මෙම සාමාජික ගාස්තු සංශෝධනය විය හැක.)

## ගෙවීම් ක්‍රම

- AAT ප්‍රධාන කාර්යාලයේ මුදල් අයකැමි වෙත සෘජු ගෙවීම්
- www.aatsl.lk හරහා මාර්ගගත ගෙවීම්
  [ඔබට මාර්ගගත ගෙවීම් ක්‍රමයක් භාවිතා කිරීමට අවශ්‍ය නම්, ගෙවීම් ක්‍රමය හඳුනා නොගැනීමෙන් වැළකීම සඳහා ඕනෑම සෘජු ගෙවීම් ගනුදෙනු ක්‍රමයක් භාවිතා කිරීම වෙනුවට කරුණාකර AAT වෙබ් අඩවියේ මාර්ගගත ගෙවීම් ද්වාරය පමණක් භාවිතා කරන්න.]
- "ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය" වෙත රේඛණය කරන ලද චෙක්පතක් මගින්.

සාමාන්‍ය සාමාජිකයෙකු (FMAAT / SAT / MAAT) ලෙස ඇතුළත් වීමට සුදුසුකම් ඇති ඕනෑම අයෙකු පසුව යාවජීව සාමාජිකත්වය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබන අතර ඒ සඳහා වෙනම යාවජීව සාමාජිකත්ව අයදුම් පත්‍රයක් සම්පූර්ණ කළ යුතුය. සාමාන්‍ය සාමාජිකයන් සම්බන්ධයෙන් මෙන් යාවජීව සාමාජිකත්වය ලබා ගන්නා අය සඳහා වාර්ෂික අලුත් කිරීමේ ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. අදාළ සාමාජික ප්‍රභේදය සඳහා වන යාවජීව සාමාජිකත්වයට පරිවර්තනය කිරීමේ ගාස්තුව ඉහත සදහන් උසස් කිරීමේ සටහන යටතේ ඇති ගාස්තුවට සමාන වේ. වසරකට වැඩි කාලයක් සාමාජිකත්වය අලුත් නොකළේ නම් අමතර හිඟ මුදල් ද ගෙවිය යුතුය. / හිඟ මුදල් නිදහස් කර ගැනීම සඳහා ඉල්ලීම් කළ යුතුය.


**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

ඒඒටී මධ්‍යස්ථානය, අංක 540,
පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත, නාරාහේන්පිට, කොළඹ 05.
දුරකතන : +94 11 2 559 669 | +94 11 2 595 857 (දිගුව : 321, 322, 323, 324)
ෆැක්ස් : 011 2 559 299 | විද්‍යුත් තැපෑල : membership@aatsl.lk | registration@aatsl.lk | pf@aatsl.lk වෙබ් අඩවිය : www.aatsl.lk